සියලු ම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Pre-Evaluation Test – January 2021

පෙරහුරු පරීක්ෂණය - 2021 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 62 | S | I |
|---|---|---|

## Civic – I

## පුරවැසි අධ්‍යාපනය – I

Name :- .................................................... Grade : -................ Index number:-....................

- **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

1. සමාජ පරිසරය යනුවෙන් අදහස් කරන්නේ,
   (1) මිනිසාගේ මැදිහත්වීමකින් තොරව ඇතිවන සංරචකයකි.
   (2) මිනිසාගේ මැදිහත්වීමෙන් ගොඩනැගෙන්නකි.
   (3) භෞතික සංරචක හා මිනිසාගේ මැදිහත්වීමෙන් ගොඩනැගෙන්නකි.
   (4) මෙම පිළිතුරු කිසිවක් නොවේ.

2. නීතියේ ගුණාංගයක් නොවන්නේ,
   (1) වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් නොවීම.
   (2) යුක්ති සහගත හා සාධාරණ බව.
   (3) නිරවුල් හා පැහැදිලි වීම.
   (4) අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පනවන්නක් වීම.

3. මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන් පත්කරනු ලබන්නේ,
   (1) නීතිපතිතුමා ය. (2) අග්‍රාමාත්‍යවරයා ය.
   (3) ජනාධිපතිවරයා ය. (4) පොලිස්පතිතුමා ය.

4. පහත සඳහන් කරුණු අතරින් අපරාධ නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වැරදි ලෙස සැලකෙන පිළිතුර වන්නේ,
   (1) මිනීමැරුම්, මත්ද්‍රව්‍ය විකිණීම, විවාහ ගැටලු
   (2) ළමා අපචාර, විවාහ ගැටලු, ස්ත්‍රී දූෂණ
   (3) සොරකම්, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම්
   (4) මිනීමැරුම්, මත්ද්‍රව්‍ය විකිණීම, ඉඩම් ගැටලු

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

5. ''එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳ උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩුක්‍රමයට මූලික ලක්ෂණය යි.'' යනුවෙන් නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) සී.එෆ්. ස්ට්‍රෝන්ග් (2) ඒ.වී. ඩයිසි
(3) ජෝන් ඔස්ටින් (4) සීලර්

6. උරුතු පළාතට අයත් නොවන දිස්ත්‍රික්කය වන්නේ,

(1) මඩකලපුව (2) කිලිනොච්චිය
(3) මන්නාරම (4) වව්නියාව

7. ප්‍රාදේශීය සභාවක ප්‍රධානියා වන්නේ,

(1) නගරාධිපති (2) පුරපති
(3) සභාපති (4) ප්‍රාදේශීය ලේකම් ය.

8. බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් ආණ්ඩුකාරධුරයක් ඇති කරන්නේ,

(1) ඩොනමෝර් අණ්ඩුක්‍රමය මගිනි. (2) සෝල්බරි අණ්ඩුක්‍රමය මගිනි.
(3) කෝල්-මැකලම් අණ්ඩුක්‍රමය මගිනි. (4) මැනින් අණ්ඩුක්‍රමය මගිනි.

9. P - නීති විවරණය කිරීම

Q - පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

R - අයවැය පාලනය

S - අනාගත පාලකයන් පුහුණු කිරීම

T - පළාත් පාලන ආයතන හා මධ්‍යම ආණ්ඩුව අතර ගැටුම් විසඳීම.

ඉහත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතන මගින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) P, Q, R (2) P, Q, T (3) P, Q, S (4) P, R, T

10. මානව හිමිකම් සුරැකීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරනු ලැබූයේ,

(1) 1948 දී ය. (2) 1945 දී ය. (3) 1914 දී ය. (4) 1972 දී ය.

11. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති වැරදි ප්‍රකාශය වන්නේ,

(1) සෑම පුද්ගලයෙකුට ම සිතීමේ නිදහස හෘද සාක්ෂියේ නිදහසට හිමිකම් ඇත.
(2) වෘත්තීය සමිති පිහිටුවීමේ හා ඒවාට බැඳීමේ නිදහස ඇත.
(3) අතීතයට බලපාන දණ්ඩ නීති පැනවීම කළ හැකි වේ.
(4) භාෂණයේ නිදහස, සමාගමයේ නිදහස ඇත.

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

12. ලෝකයේ ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජ සඳහා හොඳ ම නිදසුනක් වන රටවල් අයත් පිළිතුර වන්නේ,

(1) ශ්‍රී ලංකාව, ඉන්දියාව (2) ඇමරිකා එක්සත් ජනපදය, චීනය
(3) ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව (4) පකිස්ථානය, චීනය

❖ පහත ප්‍රකාශ කියවන්න.

E – ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 3500 කට වඩා වැඩි ය.

F – ළදරු මරණ අනුපාතය පහළ අගයක් ගන්නා අතර ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ මට්ටමක පවතී.

G – ඉහළ සාක්ෂරතා ප්‍රතිශතයක් පවතී.

H – මානව සංවර්ධන දර්ශකය 0.80 ට වඩා වැඩි ය.

13. සංවර්ධිත රටවල ලක්ෂණ පිළිබඳ ඉහත ප්‍රකාශ සලකා බැලීමේ දී වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) E, F, G, H පිළිතුරු සියල්ල නිවැරදි ය. (2) E, G, H පමණක් නිවැරදි ය.
(3) E, F, G පමණක් නිවැරදි ය. (4) F, G, H නිවැරදි ය.

14. රටක සංවර්ධනය මැනීම අවශ්‍ය වන වැදගත්ම කාරණය වන්නේ,

(1) එකිනෙක රටවල් සමග තරග කිරීමට සැලසුම් කිරීම.
(2) ආර්ථික, සාමාජීය, සදාචාරාත්මක ගැටලු හඳුනාගැනීම.
(3) ලෝකයේ බලවතුන් ලෙස අන් රටවල් අභිබවා කටයුතු කිරීම.
(4) මින් එක පිළිතුරක්වත් නොවේ.

15. දිළිඳුබවේ විෂම චක්‍රය සඳහා හේතුවන කරුණක් නොවන්නේ,

(1) ඉතුරුම් වැඩිවීම. (2) නිෂ්පාදනය අඩු වීම.
(3) ඉහළ පරිභෝජන වියදම (4) ප්‍රාග්ධනය අඩු වීම.

16. රාජ්‍යයන් තුළ ජාත්‍යන්තර සබඳතා වර්ධනය කරගැනීමේ ලා බලපෑ සාධකයක් වන්නේ,

(1) තම තම අවශ්‍යතා ඒ ඒ රටේ ම නිපදවා ගත හැකි වීම.
(2) ප්‍රවාහන හා සන්නිවේදක ක්‍රම දියුණු වීම.
(3) සම්පත් විසංතුලනය
(4) හදිසි ආපදා තත්ත්ව වලදී සහාය ලබාගත නොහැකි වීම.

17. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් පොදුවේ එක ලෙස ම වර්තමානයේ මුහුණපාන ගැටලුවක් වන්නේ,

(1) පරිසර දූෂණය (2) ප්‍රාග්ධන හිගය
(3) අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා (4) බලශක්ති අර්බුදය

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

18. එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන අතර සාගින්න, දරිද්‍රතාව පිටුදැකීම ප්‍රධාන අරමුණු කරගත් සංවිධානය වන්නේ,

(1) ILO සංවිධානය (2) UNDP සංවිධානය

(3) WTP සංවිධානය (4) WHO සංවිධානය

19. ජාත්‍යන්තර සම්බන්ධතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) නිෂ්පාදන ප්‍රතිඅපනයනයෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් නොලැබී යාම.

(2) ණය ආධාර ලබාදීමේ දී ලබා දෙන රටේ භෞතික හා මානව සම්පත් අදාළ ව්‍යාපෘති සඳහා යොදාගත යුතු වීම.

(3) රැකියා වෙළඳපොළේ දී ජාත්‍යන්තර වශයෙන් මැදපෙරදිග හා දකුණු කොරියාව ශ්‍රී ලංකා ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් සපයන්නේ නැත.

(4) ජාතික ආරක්ෂාවේ දී ත්‍රස්තවාදී කණ්ඩායම් සඳහා රහසිගත අවි සැපයීම්, ලංකා රජය වෙත අධික මිල අවි අලෙවිය අභියෝගාත්මක ය.

20. වනභායනය නිසා ඇති වී තිබෙන අහිතකර ප්‍රතිඵලයක් වන්නේ,

(1) ගෝලීය උණුසුම පාලනය වීම. (2) පාංශු තෙතමනය ඉවත් වීම.

(3) ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය ක්‍රමවත් වීම. (4) පරිසර සෞන්දර්යය ආරක්ෂා වීම.

21. පොදුරාජ්‍ය මණ්ඩලයීය ආරම්භක රටවල් කාණ්ඩය දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මහා බ්‍රිතාන්‍ය, ඉන්දියාව, නවසීලන්තය

(2) ශ්‍රී ලංකාව, සිම්බාබ්වේ, මහා බ්‍රිතාන්‍ය

(3) දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව

(4) ඉන්දියාව, ඕස්ට්‍රේලියා, දකුණු ඇමරිකාව

22. පාරිසරික ගැටලු නිසා ලොව බොහෝ රටවල් පීඩාවට පත්ව තිබේ. එවැනි ගැටලු තත්ත්වයන්ට මුල්වන ප්‍රධානතම හේතුව වන්නේ,

(1) සම්පත් අධිපරිබෝජනය (2) සම්පත් ආරක්ෂාව පිළිබඳ අනවබෝධය

(3) සම්පත් විෂමව බෙදීයාම (4) ස්වාභාවික සම්පත්වලට සාධාරණ මිලක් නොලැබීම.

23. ශ්‍රී ලංකාව —(අපනයනය / ඇඟලුම්)→ ඇමරිකා එක්සත් ජනපදය

ශ්‍රී ලංකාව ←(ආනයනය / කිරිපිටි)— නවසීලන්තය

ඉහත ගනුදෙනුව තුළ ශ්‍රී ලංකාව, නවසීලන්තය කිරිපිරි ආනයනය සඳහා ගෙවන මුදල ඇමරිකාවෙන් ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබෙන මුදලින් ගෙවිය හැක. එහි දී සිදු වනුයේ,

(1) ද්විපාර්ශ්වීය වෙළෙඳාමකි. (2) බහුපාර්ශ්වීය වෙළෙඳාමකි.
(3) ද්විපාර්ශ්වීය හා බහු පාර්ශ්වීය වෙළෙඳාමකි. (4) ඒකපාර්ශ්වීය වෙළෙඳාමකි.

24. විසිරී ඇති නිෂ්පාදන සාධක එකලස් කරමින් සිදු කරන ක්‍රියාවලිය,

(1) ශ්‍රමය යෙදවීම (2) ව්‍යවසායකත්වය
(3) බෙදාහැරීම (4) ප්‍රාග්ධනය යෙදවීම

25.
- දේපල අයිතිය රජය සතුවීම
- ආදායම් අසමාන ලෙස බෙදීයාම
- වෙළඳපොළ මත භාණ්ඩවල මිල තීරණය වුවද රජය ඒ සඳහා මැදිහත් වීම

ඉහත ලක්ෂණ පිළිවෙළින් දක්වෙන අර්ථක්‍රමය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) සමාජවාදී / ධනවාදී / මිශ්‍ර අර්ථක්‍රම (2) මිශ්‍ර / ධනවාදී / සමාජවාදී අර්ථක්‍රම
(3) මිශ්‍ර / සමාජවාදී / ධනවාදී අර්ථක්‍රම (4) ධනවාදී / සමාජවාදී / මිශ්‍ර අර්ථක්‍රම

26. ''පාසල් පරිසරයේ දී වුවද සිසුන් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස ඔබට වැදගත් වේ.'' මෙම අදහස හා නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

(1) සාකච්ඡා මගින් තීරණවලට එළඹීම. (2) අන්‍ය මත නොඉවසීම.
(3) යුතුකම් අගයමින් කටයුතු කිරීම. (4) සමානාත්මතාවයෙන් ක්‍රියා කිරීම.

27. ''ජය ජය විසඳුම්'' ලබාදීම මගින් ගැටලු නිරාකරණය කරගත හැකි ක්‍රමයක් වන්නේ,

(1) විනිසීම (2) කේවල් කිරීම
(3) සාකච්ඡා ක්‍රමය (4) මැදිහත්කරණය

28. දැනට සිදු වෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාවට අත්වන වාසියක් නොවන්නේ,

(1) සේවා වියුක්තිය ඉහළ යාම. (2) විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම.
(3) සාමය පවත්වා ගැනීමට හැකි වීම. (4) ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම.

29. සමාජවාදී අර්ථක්‍රම පැවති රටවල් පවා නව ලිබරල්වාදී අර්ථක්‍රමයත් සමග වර්තමානයේ නව වෙළඳපළ ආර්ථික සංකල්ප ක්‍රියාත්මක කරමින් සිටී. එවැනි රටවල් පමණක් දක්වෙන රටවල් කාණ්ඩය,

(1) චීනය, පෝලන්තය, ඇමරිකාව (2) චීනය, රුසියාව, ජපානය
(3) රුසියාව, චීනය, පෝලන්තය (4) සිංගප්පූරුව, මැලේසියාව, චීනය

30. යම් නිෂ්පාදනයක් සිදු කරනුයේ කුමන අංශයක ද යන්න තීරණය කිරීමේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව සිදු කරන නිෂ්පාදනයන් සඳහා උදාහරණයක් වන්නේ

(1) දුම්රිය සේවය (2) ඛනිජ තෙල්
(3) මංමාවත් ඉදිකිරීම (4) රාජ්‍ය අංශයේ අධ්‍යාපනය

සියලු ම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

31. පුද්ගල වුවමනා,
   (1) අසීමිත ය.
   (2) විවිධ නොවේ.
   (3) පුද්ගල සමාජ ආර්ථික තත්ත්ව අනුව විවිධ නොවේ.
   (4) ඉටුකර ගැනීමට සම්පත් ප්‍රමාණවත් ව ඇත.

32. සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,
   (1) භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවල පරිපාලන තීන්දු ගැනීමට අපහසු වීම.
   (2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම.
   (3) රාජ්‍යයේ ස්වාධිපති බලය එක් බල මධ්‍යස්ථානයක් වෙත ඒකරාශී වී පැවතීම.
   (4) රාජ්‍යයන් අත්තනෝමතිකව ක්‍රියා කිරීම.

33. බහු සංස්කෘතික සමාජයක යහපාලනයක් ක්‍රියාත්මක වීමේ දී ආර්ථික වශයෙන් අනන්‍යතාවය ප්‍රකාශ වන පිළිතුර වනුයේ,

   P – යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

   Q – දේශපාලන නායකත්වයට ගරුකිරීම.

   R – කැමති දේශපාලන මතයක් දැරීම.

   S – විවිධ උත්සව පැවැත්වීම.

   T – වෘත්තිය සමිති පිහිටුවා ගැනීම.

   (1) P හා R ය. (2) Q හා R ය. (3) P හා S ය. (4) P හා T ය.

34. ප්‍රාන්තයක් යනු,
   (1) සන්ධීය රාජ්‍යයක ප්‍රාදේශීය ආණ්ඩුව යි.
   (2) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ආණ්ඩුව එක්ව කටයුතු කරන ආයතනයකි.
   (3) ඒකීය රාජ්‍යයේ පාර්ලිමේන්තුව යි.
   (4) මධ්‍යම ආණ්ඩුවට බලය බෙදාහරින ආයතනය යි.

35. ක්‍රි.ව. 1973 දී ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා ස්ථාපිත කළේ,
   (1) දේශපාන අධිකාරී ක්‍රමය (2) පළාත් සභා ක්‍රමය
   (3) මහ නගර සභා ක්‍රමය (4) දේශපාලන පක්ෂ ක්‍රමය

36. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා පත්කරනුයේ,
   (1) නීතිපතිතුමා විසිනි. (2) ජනාධිපතිතුමා විසිනි.
   (3) ආණ්ඩුකාරවරයා විසිනි. (4) අගමැතිවරයා විසිනි.

37. දේශසීමා පදනම් කරගෙන ප්‍රබල ගැටුම් නිර්මාණය වී ඇති රාජ්‍යයක් වන්නේ,
   (1) අයර්ලන්තය (2) ඊශ්‍රායලය
   (3) රුවන්ඩාව (4) සිරියාව

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

38. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,

(1) පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව.

(2) ආර්ථික ප්‍රතිලාභ සැමවිටම හිමි වීම.

(3) තොරතුරු දැනගැනීමේ අයිතිය.

(4) ජනතාවට ආණ්ඩුව වෙත අදහසක් ප්‍රකාශ කිරීමේ හැකියාව

39. පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බෙහෙත්, ආහාර (2) ගෘහ භාණ්ඩ, පොහොර

(3) ඇඳුම් පැළඳුම්, දැව (4) යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ

40. සංවර්ධන මිනුම් සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ කියවන්න.

x – ඒක පුද්ගල ආදායමේ ඌන පූර්ණයක් ලෙස භෞතික ජීවන තත්ත්ව දර්ශකය යොදා ගැනේ.

y – මානව සංවර්ධන දර්ශකයෙන් ආර්ථික සමාජ යන අංශ දෙකම මැන ගැනීමට උපකාරී වේ.

z – දළ ජාතික නිෂ්පාදනයේ දී ආර්ථික තොරතුරු මෙන්ම සමාජ සුබසාධනය පිළිබඳව ද මැන බැලේ.

(1) x, y, z සියල්ල වැරදි ය. (2) x, y පමණක් නිවැරදි ය.

(3) x, z පමණක් නිවැරදි ය. (4) y, z පමණක් නිවැරදි ය.

(ලකුණු $1 \times 40 = 40$)

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – Pre-Evaluation Test – January 2021

පෙරහුරු පරීක්ෂණය - 2021 ජනවාරි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hours**

| 62 | S | II |
|---|---|---|

## Civic – II

## පුරවැසි අධ්‍යාපනය – II

Name :- .................................................... Grade : -................ Index number:-....................

- ❖ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) (i) බලයේ විවිධ ස්වරූප 2 ක් ලියන්න.

(ii) ගැටුම් ඇතිවන මූල 2 ක් ලියන්න.

(iii) මූලික ආර්ථික ප්‍රශ්න 2 ක් ලියන්න.

(iv) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 2 ක් ලියන්න.

(v) නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට හේතු 2 ක් ලියන්න.

(vi) පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප 2 ක් ලියන්න.

(vii) නීතියේ ගුණාංග 2 ක් ලියන්න.

(viii) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ආකාර 2 ක් ලියන්න.

(ix) පරිසර පද්ධති සකස් වී ඇති ප්‍රධාන සංරචක 2 ක් නම් කරන්න.

(x) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විශේෂ අරමුණු 2 ක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(2) ''සංවර්ධනය යනු ආර්ථික වර්ධනය පමණක් නොවේ. ''

(i) නූතනයේ සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 2)

(ii) ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වුවද, සංවර්ධිත ලක්ෂණවලින් යුක්ත වේ. එවැනි ලක්ෂණ 3 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අ) සංවර්ධනයේ දී සම්පත් ඵලදායීතාව දියුණු කිරීමට යොදාගන්නා ලෝකයේ භාවිත වන උපාය මාර්ග 3 ක් ලියන්න. (ලකුණු 3)

ආ) තිරසර සංවර්ධනයේ දී පුරවැසි යුතුකම් 2 ක් විස්තර කරන්න. (ලකුණු 2)

සියලු ම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(3) ශ්‍රී ලංකාවේ ප්‍රජා සංවර්ධනය විධිමත් කිරීම සඳහා පළාත් පාලන ආයතන පිහිටුවීය.

(i) ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සම්බන්ධයෙන් ඓතිහාසික අවස්ථාවන් පැවති බවට නිදසුන් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) පළාත් පාලන ආයතනවලට බලය විමධ්‍යගත කිරීමට බැලපෑ හේතු 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) අ) පළාත් පාලන ආයතන කෙරෙහි පුරවැසියන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න. (ලකුණු 3)

ආ) ඉන් එක් යුතුකමක් ඇසුරින් යුතුකම් ඉටුකිරීම, අභිමානවත් ජාතියක් ලෙස කටයුතු කිරීමට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(4) ''අර්ථක්‍රමයක් යනු, මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාරයය.''

(i) ලෝකයේ දක්නට ඇති ප්‍රධාන අර්ථක්‍රම 2 ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) නව ලිබරල්වාදී වෙළඳපළ ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) අ) ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් 3 ක් නම් කරන්න. (ලකුණු 3)

ආ) ඉන් එක් ක්‍රියාවලියක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(5) මිනිසත්බව ලැබීම හේතුකොට ගෙන උපතින් පුද්ගලයෙකුට ලැබෙන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ.

(i) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 2)

(ii) මානව අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් 3 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අ) රටවල් තුළ හා රටවල් අතර ඇතිවන යුද ගැටුම්වල දී ළමුන් මුහුණ දෙන බේදනීය තත්ත්වයන් 3 ක් ලියන්න. (ලකුණු 3)

ආ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 2 ක් විස්තර කරන්න. (ලකුණු 2)

(6) වර්තමානයේ පරිසරය පිළිබඳ දැඩි අවධානයට ලක්වන්නේ මානව බලපෑම් මගින් විවිධ විපර්යාසවලට පරිසරය ගොදුරු වීමයි.

(i) පරිසරයෙන් ලැබෙන සේවා 2 ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) මිනිසා මූලිකව සිදුවන පරිසර ගැටලු 3 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අ) දේශගුණික වෙනස් වීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 3 ක් ලියන්න. (ලකුණු 3)

ආ) එම අහිතකර ගැටලුවලට විසඳුමක් ලෙස ඔබ ප්‍රදේශයේ ජනතාවට ගත හැකි විසඳුම් යෝජනා විස්තර කරන්න. (ලකුණු 2)

(7) රටවල් අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා සුහදතාවයෙන් කටයුතු කිරීමෙන් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට යත්න දරයි.

සියලු ම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(i) යම් රාජ්‍යයක් ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම මගින් අපේක්ෂා කරන අරමුණු 2 ක් ලියන්න. (ලකුණු 2)

(ii) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමට බලපෑ සාධක 2 ක් ලියන්න. (ලකුණු 3)

(iii) අ) ජාත්‍යන්තර ප්‍රජාව විසින් ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල කරන බලපෑම් 3 ක් සඳහන් කරන්න. (ලකුණු 3)

ආ) එය අභියෝග හමුවේ ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 2 ක් විස්තර කරන්න. (ලකුණු 2)